නාගරික සංවර්ධන අධිකාරිය

# තිරසර පුරවර

திரசர புரவர | THIRASARA PURAWARA

ත්‍රෛමාසික පුවත් සඟරාව 03 වෙළුම 2017 ඔක්තෝබර් - දෙසැම්බර් කලාපය

## ගරු අමාත්‍යතුමන්ගේ නව අවුරුදු පණිවිඩය

### 2018 සන්ධිස්ථානයක්

සියළු දෙනාටම සුභ නව වසරක් වේවා කියා ප්‍රාර්ථනා කරනවා. සාමාන්‍යයෙන් ශ්‍රී ලාංකික අපි සිංහල අලුත් අවුරුද්ද සමරන්නේ අප්‍රේල් මාසේ. නමුත් අද ලෝක සම්ප්‍රදාය වී තිබෙන්නේ බටහිර ජාතීන්ගේ බලපෑම මත ජනවාරි 1 වෙනිදා අලුත් අවුරුද්ද ලෙස පිළි ගන්නටයි. ඒ අනුව අපිත් අද සිට 2018 වර්ෂයට පිවිසෙනවා. ඒ නිසා ශ්‍රී ලාංකික ඔබ සැමගේම දින දර්ශනය සකස් වෙලා තිබෙන්නෙ ජනවාරි 1 වෙනිදා ඉඳන් නිසා ඔබ සියළු දෙනාටම සුභ නව වසරක් වේවා කියා නැවතත් අපි ප්‍රාර්ථනා කරනවා.

2018 වර්ෂයේ අපේ අභියෝග මොනවාද? මට දැනෙන ආකාරයට නම් 2018 වසරේ ලොකුම අභියෝගය එල්ල වෙලා තිබෙන්නේ පරිසරයෙන්.ලෝකයේ අලුත් අනාථයින් පිරිසක් මේ නිසා බිහි වෙලා තිබෙනවා. කලක් සන්නද්ධ සටන් නිසා ආගමික ජනවාර්ගික දේශපාලනික හේතු නිසා අනාථයින් බිහි උනා. නමුත් දැන් අනාථයින් බිහිවෙමින් තිබෙනවා කාලගුණික ප්‍රශ්න නිසා. ජලය නැති වීම නිසා. එහෙම නැත්නම් ජලය වැඩිවීම නිසා. ඒ වගේම කුසගින්න නිසා නැවත ගැටළු ගණනාවකට මුහුණ දෙන්න ලෝකයට සිදුවෙලා තිබෙනවා.

ඒනිසා 2018 වර්ෂයේ ලංකාවේ අභියෝගය අනාගතයට අපි ජල කළමනාකරණය කරන්නේ කොහොමද කියන එකයි. මේ ප්‍රශ්නය මම කිහිප වතාවක්ම මේ සමාජය ඉදිරියේ තබා තිබෙනවා. ජලය නැති ප්‍රදේශවලට ජලය ලබාදෙන වැඩපිළිවෙලක්. ජලය වැඩි ගංවතුරෙන් පෙළෙන ප්‍රදේශවල ගංවතුර පාලනය කරන වැඩපිළිවෙලක්. ඒ වගේම වැඩිවන නාගරික ජනතාවට හා රෝග පීඩාවලින් පෙළෙන ජනතාවට විශේෂයෙන් වකුගඩු රෝග ආදියෙන් පෙළෙන ජනතාවට පානීය ජලය ලබාදෙන වැඩ පිළිවෙලක් රටට අවශ්‍යයි.

ඒ වගේම මේ රටේ අලුතින් හිතන, අලුතින් ගමන් කරන පිරිස්වලට ඒ ඒ දේශපාලන පක්ෂ ඇතුළත විශාල වශයෙන් අලුත් ගමනක් යෑමට අවශ්‍ය කරන වටපිටාව මේ 2018 වර්ෂයේ උදාවීමට ඉඩ තිබෙනවා.

අපේ සෑම දරුවෙකුටම, රටේ උරුමය, ජාතියේ උරුමය, පක්ෂවල උරුමය ලැබෙන නව යුගයක් කරා අපි පිය මනිමු. ඒ වගේම ඔබටත්, විශේෂයෙන්ම ඔබේ දූ දරුවන්ට රන්වන් අනාගතයකට මග හසර 2018 වර්ෂයේ උදාවේවා කියා මම නැවත ප්‍රාර්ථනා කරනවා.



## "We follow social market economy in place of the open economic model considering the economic disparity and environmental concerns" ...

Hon.Patali Champaka Ranawaka. at UDA Developers Forum 2017.




**UDA has organized developers forum on 24th November 2017 at the Water's Edge Hotel to declare the opportunities avail with Urban Development Authority before the larger gathering of potential developers participated from both local and foreign conglomerates.**

**While addressing the gathering Hon.Patali Champaka Ranawaka ,Minster of Megapolis & Western development stated the future role of UDA will be multi faceted in upbringing economy of the country with greater environmental concern.**

Ministers full speech is stated below.

I am very happy to be here at the UDA Developers Forum 2017.
This is one of the main activities of the UDA to attract the investors and developers both local and global. Therefore, it is with very much rejoice I join this Forum 2017.

This is what the new government is keen on doing by encouraging genuine and serious investors to invest in our major infrastructure projects. These projects are necessarily associated with our modern smart city concept. Where we have planned out infrastructure to suit the modern-day requirements with a futuristic aspect in mind and promoting Private Public Partnerships. When we talk about the futuristic world scenario, it is better for us to examine briefly the historical perspective of the development phases of the modern-day society. Accordingly, at the outset let me explain the evolution of the technological revolution.
Dear friends,

To begin with the world is rapidly changing towards to a knowledge based economy and the contemporary global context we are facing the 4th Industrial revolution. The first industrial revolution started with the replacement of muscle power with the machine power. The second phase started with the introduction of fossil fuels to power the machines. The third revolution was the introduction of the data storage and communication era.

However, the fourth Industrial Revolution can be described as number of technologies synergizing together. To elaborate further this is mainly internet of things, Smart Age Technologies, Cloud Applications, Nano Technology which can change the characteristics of materials, quantum technology which can change the substance of materials, bio technology which can change the biotic characteristics of bio forms, neuro science related developments which can enhance thinking and brain capacity, and furthermore developments in Automation, Robotics, Drones, etc.

A unique feature of this phase would be the enhancement of vast knowledge streams by one another. Due to this day by day we can see new synergies are being developed.
For an example we can see the new city development concept namely resourceful cities. This implies that whatever the resource we have whether it is water, energy, air quality, we need to use it technically and optimally, conserve, recycle etc. In this economic model our capacities are developed within optimally.

...... contd 2 nd page

## We follow social market economy

....From 1st page

Dear Friends,
Another important characteristic would be global warming and environmental pollution associated with the major cities. For example, New Delhi has a pollution level of 70 times more than the stipulate WHO levels. This is equivalent to a person smoking 44 cigarettes per day. (Fortunately, we have adopted the vehicle emission testing in 2008 when I was the Environmental Minister. I am happy to inform you that Colombo is the only city in the South Asian region during the past decade which has been able to reduce its level of pollution.)

Furthermore, the scarcity of resources has led to questioning of the linear growth of the development paradigm. The pure market base development paradigm is now been challenged. This is due to inability of the market based model to give a value for anything other than the instantaneous transactions.

This has resulted in the emergence of novel concepts such as green energy, green resources, green capital, green transportation etc. The foundation of these concepts is the cyclic economy.

Ladies and Gentlemen,
The third factor is somewhat socio political in nature which is the dynamic changing of the socio-political situation throughout the world. This has resulted in stagnation of the traditional old state oriented economies and the success of the western liberal economic model. This has resulted in the concept of creative destruction.

In my view the creative destruction is happening both in a biological sense by generation to generation as well as in a technological sense.  This is why in the biological sense the norm is to change a constitution of a State at least every twenty years.

The technological creative destruction is also clearly visible in the present-day context. We can see some of the major companies in the




***"Head of SriLanka operations of  Jones Lang Laselle ,the leading conglomerate stand for real estate consultation stated ,that Urban Development Authority has rightly recognized the market trend of real estate growth in the region"***

- *Colombo district accommodates 12% of Sri Lanka's total population*
- *Rents in CBD sub market have increased 7% to 10% y-o-y in Grade A buildings*
- *Predicts retail mall stock will multiply 2.6 times in the next 4-5 years*

Sunil Subramanian the country head of Jones Lang Lasalle, further pointed out that the Government's plans to make Sri Lanka the most competitive economy in South Asia will contribute to the incremental demand for housing, retail, grade A office space and hotels in the next five years as Colombo is one of the major industrial as well as trade and commerce hubs in the country.

The issue at hand is that the consumption of the existing generation greatly impacts on the consumption of the future generation. This is mainly due to the fact that the future generation as well as present generation of all living beings have not contributed to the demand and supply of the market. Therefore, the existing model cannot evaluate the market value of the demand and supply mechanism. In order to solve such issues, the western economic experts have come up with the solution of introducing regulatory mechanisms to solve the price fluctuation and other issues in the market based system. This system has its inherent weaknesses and therefore, market based development paradigm is now questionable as there is no absolute answer. This is mainly due to the inherent unpredictability of the human behavior. I order to overcome this situation the western world has invented mechanisms such as global conventions.

businesses, traditional jobs are losing their importance due to destructive technologies emerging day by day. The companies such as

Google, Alibaba, Amazon, Facebook, Air B&B etc. can be considered as technological destructive companies due to innovative approach to doing business by them.

In the societal sense, the new trend of Post truth era has surfaced challenging the absolute Truth and evolving a new political culture. This socio dynamics has created a populist

movement greatly challenging the traditional old political elite class. Someone can think that this is a movement governed by fools or set of absurd minded individuals. But this is a creative destruction and we can elaborate this using the Trump phenomena, Brexit, Right Wing Left Wing political movements in Europe, Arab Spring, Anti-corruption movements against the elite class in India, Sri Lanka and China etc.

In this backdrop what matters in the future is independent of the State and will be based on the cities. The future economic, technological, political and developmental phases will be greatly propagated by the cities and not by the States. The cities will be the center of all the activities with population centers. It has been estimated that by the year 2030, 60 % of the world population will be living in the cities. The strategic advantage of a city is its ability to give a higher return to any investor. However, Sri Lanka has got into a very high debt burden due to the wrong investments in places where there is no adequate return.

Friends,
Therefore, this government has selected the social market economy in place of the open economic model taking into account the economic disparity and environmental concerns.

We also have selected a knowledge based economy in place of resource based economy. The innovative driven strategy has been selected in place of factor driven strategy. We also have prioritized the city development model in place of uneven economic activities. All in all the message to the entire world is that Sri Lanka now has a new populist government established by the anti-corruption populist movement. Hence, I would like to emphasis that the Western Megapolise will be the future State. Local and Global private sector will be considered as our key partners. The Government will only invest in the absolute essential areas and the private sector has to do the vital investments.



***Mr. Pradeep Moraes, Chairman of the Condominium Developers Association of Sri Lanka emphatically reiterated his conviction of the sustainability and immense growth potential of the condominium Sector in SriLanka.***

He has cited a multitude of factors and figures in support of same such as growing interest among expatriate to buy over apartments in vicinity of capital city and rising opportunities among foreigners working in country for tentative stay has created huge demand during last few years.

# සංස්කාරක සටහන!

2018 එළඹෙන්නේ තවත් එක් වසරක උදාවක් ලෙස පමණක් නොවේ. නාගරික සංවර්ධන අධිකාරියට වසර 40 ක ජනතා සේවා කාලයක් සම්පූර්ණ වන්නේද 2018 වසරේ ඔක්තෝම්බර් පළමුවෙනිදාටය.ඒ නිසා මෙම වර්ෂය සුවිශේෂී වසරක් ලෙස හැඳින්වීම නිරවද්‍ය වේ.

දිවංගත රණසිංහ ප්‍රේමදාස ජනාධිපති තුමන්ගේ අභිලාෂයක් වූ නිවාස ඉදිකිරීම සහ නාගරික ප්‍රදේශ සංවර්ධනය පහසු කිරීමත් බලාත්මක කිරීමත් ප්‍රධාන නිෂ්ටාවන් ලෙස ස්ථාපනය කරමින් එතුමන් බිහිකළ අධිකාරිය තවමත් ඉන් බැහැරව නොයමින් වඩා පුළුල් වුත් සංකීර්ණ වුත් කාර්යභාරයක් ඉටුකරමින් සිටී.

සේවකයන් 45 කින් 1978 දී ආරම්භ වූ ආයතනය වර්ථමානයේ සේවකයන් 1800 වූ මානව සම්පතකින් සහ බිළියන 130 නොඅඩු ස්ථාවර වත්කම් සහිත ආයතනයක් බවට පත්ව තිබේ.

නාගරික අඩු අදායම් ලාභී නිවැසියන්ගේ ප්‍රශ්නය දැවැන්ත සමාජ ප්‍රශ්නයක් බවට පත්වූ මොහොතක එයට විසඳුම් සෙවීමට රජය පූර්ණ විශ්වාසය තබා ඇත්තේද නාගරික සංවර්ධන අධිකාරිය මත වීම මගින්ම රජය අධිකාරිය වෙත තබා ඇති එම විශ්වාශය පිලිබඳ ඉහළ සහතිකයක් ලබාදේ. 68000 ක් පමණ පවුල් ප්‍රමාණයකින් වූ එම සමස්ථ ඉලක්කය සපුරා ගැනීම අසීරු අභියෝගයක් වුවද ගරු චම්පික රණවක අමාත්‍යතුමන් මනා විචක්ෂනයකින් එම කටයුත්ත අදීක්ෂණය කරමින් කළමනාකරණය කරනු ලබයි.

සමස්ථ දිවයිනම ආවරණය වන පරිදි ක්‍රියාත්මක සුඛිත පුරවර වැඩ සටහන් මගින් සහ භාණ්ඩාගාරය මගින් ආයෝජනය කරනු ලබන සෙසු ව්‍යාපෘති මගින් නව පිබිදීමක් ඒ ඒ පුරවරයන් වෙත උදාකර දෙමින් තිබේ.

මහානගර වැඩසටහනින් අපේක්ෂා කරණ ඉල්ලක්කයන් වෙත ලඟා වීමේ මුලික අදියරේ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාකාරකම් ආරම්භ වී ඇත. කොළඹ නාගරිකයේ කසළ කළමනාකරණ ඉලක්කයන් සපුරාගනිමින් පවතී.

නාගරික රථවාහන තද බදයට කෙටි කාලීන විසඳුම් සාර්ථක වීම නිසා සැහැල්ලු දුම්රිය ස්ථාපිත කිරීමේ මුලික ශක්‍යතා අධ්‍යයනයන් සිදුකරමින් පවතී.

මහා පරිමාණයේ ඉදිකිරීම් මුළු කොළොඹ නගරයම සිසාරා සිදුවෙමින් ඇති අතර ඒ බොහොමයක් අධිකාරිය මගින් ආයෝජකයන් වෙත ලබා දුන් බිම් තීරු වීම සුවිශේශී වේ.

මේ අනුව ඉදිරි දශකය මේ නව සංවර්ධන ඉලක්ක පුර්ණය කිරීමේ අර්ථයෙන් ගත් විට අධිකාරියේ කාර්ය මණ්ඩලයට අතිශයින් වුත් අභියෝගාත්මක වුත් සුවිශේසී කාලයක් වනු නොඅනුමානයි.

www.uda.gov.lk

www.facebook.com/uda.gov.lk





*“2018 is approaching us with lots of new hopes and packs of old memories. In this year that the UDA is celebrating its 40th anniversary, we must look back and learn from our experiences in the past of the mistakes we did, shortfalls we had and the drawbacks we got, and determine not to have them repeated, while carrying the good practices, team spirit and friendly image into the new era. Let's keep our eyes and ears wide open into the grand new world that is in front of us and the numerous opportunities that it offers to us. We shall seek for what is most appropriate to us not forgetting that the best of gold is always embedded deep in dirt. I'm certain that we, all in the UDA, will have the health, wealth and the strength to reach where we want to be at the dawn of 2019, and to meet the challenges on our way.”*

**Dr. Jagath Munasinghe, Chairman,**
**Urban Development Authority**



*“නාගරික සැලසුම් සකස් වන්නේ ප්‍රතිපත්තිමය කරුණු මත පදනම්ව බැවින් රජයක් මාරුවූ පමණින් එය වෙනස් විය යුතු නැහැ. ඒ නිසා එළැඹෙන නව වසරේ අප අධිකාරියේ විශේෂඥ කණ්ඩායම් වෙත විශාල වගකීමක් පැවරෙනවා ඉතාම කාලීන වූ චිරස්ථායි නාගරික සැළසුම් නිර්මාණය කර දියත් කිරීමට.”*

**ඉංජිනේරු සුමේධ රත්නායක,අධ්‍යක්ෂ ජෙනරාල්,**
**නාගරික සංවර්ධන අධිකාරිය.**

නගරයේ භූගෝලීය පිහිටීම ,ජන ඝනත්වය ,ප්‍රවේශ වීමේ පහසුකම් ,වාණිජ වශයෙන් නගරයේ වැදගත්කම වැනි මුලික කරුණු මත නාගරික සැලසුම් සකස් කරනු ලබනවා .

නාගරික සැලසුමක් යනු හුදෙක් කොළයක අඳින ලබන සැළැස්මකට එහා ගිය දෙයක්.වර්තමානයේ අපේ අර්ථකථනය වන්නේ එහි මුලික තේමාවෙන් ඔබ්බට යමින් "නාගරික සංවර්ධනය සහ ආයෝජනය" සඳහා වූ සැළැස්මක් සකස් කිරීමයි. මෙය කළ හැක්කේ එහි දැනුම සහ විෂය පරිචය පිලිබඳ ඉහළ දැණුමක් ඇති අයට පමණයි.

ඕනෑම මහා නගරයක් ගොඩනැගීමට අයෝමය දේශපාලන හස්තයක් අවශ්‍යයි.මේ සඳහා ලෝක ඉතිහාසයෙන් ද ඕනෑ තරම් උදාහරණ දිය හැකියි. වත්මනෙහි අධිකාරියට එය ලැබී තිබෙනවා. මේ නිසා අනවශ්‍ය දේශපාලන ඇඟිලි ගැසීම් කිසිවක් අද අධිකාරියට සිදුවන්නේ නැහැ.

**උපුටා ගැනීම ”ගිරය” වැඩසටහන ස්වාධීන රූපවාහිනිය.**



*“මහා නගර සංකල්පය සහ මහා නගර සැලැස්ම තවත් එක් සැලසුමක් නොවේ. මහ පොළවේ පිහිටුවිය හැකි යථාර්තයක්වීමට නම්. මෙම සැලැස්මේ ඇති ගැඹුරු දර්ශනය කුමක්ද , යන්න අප වටහා ගත යුතුයි.මහා නගර සංකල්පයෙන් ජනතාවට යහපතක් සැලසිය යුතුවාක් මෙන්ම. ජීවත්වීමට සුදුසු පරිසරයක් නිර්මාණය වීම අත්‍යවශ්‍යයි”*

**මාධව වෛද්‍යරත්න, අතිරේක ලේකම්,**
**මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය.**

අප වටහා ගත යුතු වන්නේ කොළඹ නගරයෙන් 50% ක ජනතාවක් පැල්පත්වාසීන් වීම මෙන්ම අඩු අදායම් ලබන ජනතාවක් බවයි. මේ අයට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම අපගේ මූලික වගකීමයි. මෙහිලා රජයේ ප්‍රතිපත්තිය වන්නේ කොළඹට කේන්ද්‍ර වූ සංවර්ධනයක් නොව ජාතික තුලිත සංවර්ධනයක්. කෙසේ වෙතත් දළ ජාතික නිෂ්පාදනයෙන් 50% ක් නියෝජනය කරන ජනගහනයෙන් 12% ක් නියෝජනය කරන රටේ ජාතික ආර්ථික අපිකේන්ද්‍රය **(epicenter)** පවත්නා කොළඹ නගරය මෙම සැලසුමෙහි කේන්ද්‍රය සේ සැලකීම අතිශයින්ම ප්‍රායෝගිකයි. මෙහිදි අපගේ සමාජ ආර්ථික සංවර්ධනයට අවශ්‍ය සාධක කොළඹ නගර වෙත කෙසේ කේන්ද්‍රගත කළ යුතුද යන මූලික අවශ්‍යතාවයක් ලෙස පැන නගිනවා.

තේ, පොල්, රබර් සහ පසු කලෙක ඇගළුම් මත පදනම්වූ අගය එකතු කිරීම ඉතාම පහළ ස්ථරයක තිබෙන සම්ප්‍රදායික ජාතික ආර්ථිකයක් ඉහළ සමාජ ආර්ථිකයකට පරිවර්ථනය කරමින් අප කොටුවී ඇති මැදි ආදායම් උගුලෙන් වියුක්ත විය හැකි වන්නේ දැනුම මත පදනම් වූ නවෝත්පාදනය මූලික කරගත් දැවැන්ත පිම්මකට ප්‍රවිශ්ඨ වීමෙන් පමණි.

**උපුටා ගැනීම ”ගිරය” වැඩසටහන ස්වාධීන රූපවාහිනිය.**



*“We completed the year 2017 with a strong financial position, improved services and many internal changes to serve our customers better.*

*We have taken a much bigger task in 2018. Looking forward to see success chasing you as we move forward ambitiously towards achieving goals in 2018 and hope the climb up the ladder of success is smooth and free of obstacles for us in this year.”*

**Chandana Ranasinghe,**
**Working Director, Urban Development Authority**

# UDA දිනපොතෙන්

## දෙසැම්බර් 21

2017 දෙසැම්බර් 21 හෝමාගම බස් නැවතුම්පොළ අදියර II ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් ජනතා අයිතියට පත් කරන ලදී .

## දෙසැම්බර් 15

නාගරික සංවර්ධන අධිකාරියේ වාර්ෂික ක්‍රීඩා උළෙල - 2017 මහනගර ගරු අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාන්ගණයේදී උත්කර්ෂවත් ලෙස පැවැත්විණි.



## දෙසැම්බර් 07

නාගරික සංවර්ධන අධිකාරියේ සුබිත පුරවර වැඩසටහන මගින් රුපියල් මිලියන 240ක වියදමකින් ඉදිකරන ලද පොලොන්නරුව සංචාරක තොරතුරු මධ්‍යස්ථානය, සංචාරක පොලීසිය, වාණිජ සංකීර්ණය සහ සති පොල අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ මහානගර අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමාගේ සහභාගීත්වයෙන් ජනතා අයිතියට පත් කෙරිණ.

## නොවැම්බර් 27

මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යංශයේ මග පෙන්වීමෙන්,නාගරික සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක බේරේ වැව සංවර්ධන සැලසුම මහනගර අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.එම සැලසුම රන්මසු පුර නමින් එළි දැක්වුණු අතර ඉදිරියේදී බේරේ නම වෙනුවට රන්මසුපුර නමින් භාවිතා වනු ඇත.



## නොවැම්බර් 24

නාගරික සංවර්ධන අධිකාරිය මගින් සංවිධානය කල සංවර්ධකයින්ගේ සංසදය 2017 Waters Edge හෝටලයේදී මහනගර අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. කොළඹ නගරය තුල මේන්ම දිවයින පුරා පිහිටි ඉහළ වාණිජ වටිනාකමකින් යුත් භූමි භාගයන් ගණනාවක් මිශ්‍ර හෝ සුදුසු සංවර්ධන වැඩසටහනක් සඳහා යොදාගැනීමට ආයෝජකයින් වෙත ඉදිරිපත්කිරීම සිදු විය.

## නොවැම්බර් 23

ටොරින්ටන් මහල් නිවාස සංකීර්ණයේ ඉදිකිරීම් ආරම්භ කිරීම මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කොළඹ 07, ටොරින්ටන් මාවතේ නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩමේ දී සිදු කෙරිණ.

## නොවැම්බර් 22

කොළඹ නගරයේ අධික රථවාහන තදබදය අවම කිරීම සඳහා මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කරනු ලබන සැහැල්ලු දුම්රිය මාර්ග පද්ධතිය ඉදිකිරීමේ මූලික අදියර ලෙස ශක්‍යතා වාර්තාව හා උපදේශන කාර්යයන් සඳහා ජාත්‍යන්තර උපදේශක මට්ටමේ ආයතනයක් වන කොරියාවේ සෙන් යං ආයතන හා ගිවිසුම් ගත වීම මහානගර සංවර්ධන හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් බත්තරමුල්ල සුහුරුපායේදී සිදුවිය.

## නොවැම්බර් 13

නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය ඉදිකළ "ලක්සෙත සෙවන" නිවාස සංකීර්ණය ජනතා අයිතියට පැවරීම අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමාගේ සහභාගීත්වයෙන් ජනතා අයිතියට පැවරිණි.



## නොවැම්බර් 11

ඉදිකිරීමට යෝජිත තාක්ෂණික නගරය පිළිබඳව හෝමාගම සහ මාහේනවත්ත ප්‍රදේශවාසීන් දැනුවත් කිරීමේ විශේෂ හමුවක් හෝමාගම අමල්කා හෝටලයේදී පැවැත්විණි.මේ සඳහා මහනගර අමාත්‍යංශයේ අතිරේක ලේකම් මාධව වෛද්‍යරත්න නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂක ජෙනරාල් සුමේධ රත්නායක ,තාක්ෂණික නගර ව්‍යාපෘති අධ්‍යක්ෂ ලාල් ප්‍රේමනාත් ඇතුළු පිරිසක් සහභාගී විය.



## ඔක්තෝබර් 01

කොළඹ නාගරික මහල් නිවාසවල ජීවත්වන දරුවන්ගේ සෞන්දර්යාත්මක ප්‍රාසාංගික නිර්මාණ එළි දැක්වීමේ රිද්ම සැරිය ප්‍රසංගය අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මහානගර ඇමති චම්පික රණවක මැතිතුමාගේ සහභාගීත්වයෙන් බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණි. ලෝක ළමා දින සැමරුම් ප්‍රසංගයක් ලෙස මෙය පැවැති අතර නාගරික සංවර්ධන අධිකාරියේ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියේ උපදේශක අංශය මෙය සංවිධානය කරන ලදි.



## නොවැම්බර් 08

නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය මගින් ඉදිකරන ලද 'ලක්සඳ සෙවණ මහල් නිවාස සංකීර්ණය තෙවන අදියර ජනතා අයිතියට පත්කිරීම අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමාගේ සහභාගීත්වයෙන් කොලොන්නාව, සාලමුල්ල ලක්සඳ සෙවණ නිවාස සංකීර්ණයේදී සිදු කෙරුණි.

## නොවැම්බර් 03

පානදුර බස් නැවතුම ජනතා අයිතියට පත් කෙරිණි. මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් වරාය හා නාවුක අමාත්‍ය මහින්ද සමරසිංහ ඇතුළු පිරිසකගේ සහභාගීත්වයෙන් ජනතා අයිතියට පැවරුණු පානදුර බස් නැවතුම නාගරික සංවර්ධන අධිකාරියේ නාගරික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණින් ක්‍රියාත්මක සුබිත පුරවර සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රතිපාදන සහ සැළසුම් දායකත්වය යටතේ මෙය ඉදිවිනි.

## ඔක්තෝබර් 31

මෙත්සඳ සෙවණ මහල් නිවාස සංකීර්ණයේ පළමු අදියර අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මහනගර අමාත්‍ය චම්පික රණවක මැතිතුමාගේ සහභාගීත්වයෙන් ජනතා අයිතියට පැවරිණි.

## ඔක්තෝබර් 26

කොළඹ ජාත්‍යන්තර මූල්‍ය නගරයේ ප්‍රගතිය පිළිබඳව මාධ්‍ය දැනුවත් කිරීමේ විශේෂ සාකච්චාවක් මහනගර අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මූල්‍ය නගර භූමියේදී පැවැත්විණි. ඉන් අනතුරුව වැඩ භූමියේ නිරීක්ෂණ චාරිකාවකට ද අමාත්‍යතුමන් ඇතුළු මාධ්‍යවේදීන් එක්විය.

# නාගරික සංවර්ධන අධිකාරියේ මළල ක්‍රීඩා උළෙල

ක්‍රීඩා උළෙල 2017

ගරු මහා නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමන්ගේ අදහස අනුව දෙවනවරටත් සාර්ථක ලෙස පැවැත්වුණු අන්තර් නිවාස ක්‍රීඩා උළෙල පසුගිය 15 වන දින පැවැත්වුණු වගයි...





ක්‍රීඩා සංගමයේ සභාපතිතුමන් මෙහෙයුම් කටයුතු කරමින්



දුර පැනීම 30-40 වයස් කාණ්ඩය



400 x 4 කාන්තා තරඟයේ යෂ්ටි හුවමාරුව



දුර පැනීම 40-50 වයස් කාණ්ඩය ...ජයගත්තෝ ...



200 මී ,අතිශූර ක්‍රීඩකයෝ,පදක්කම් ලබමින් ..



මී 1500 , 50-60 වයස් කාණ්ඩය ජයග්‍රාහකයෝ


දුර පැනීම ශූරියෝ ,50-60 වයස් කාණ්ඩය..පදක්කම් ලැබීමෙන් අණතුරුව


මී 200, 30-40 වයස් කාණ්ඩය ...ධාවනයේ උද්වේගකර අවස්ථාවක්


1500 මී ,40-50 වයස් කාණ්ඩය ....පදක්කම් ලාභීන්


50-60 වයස් කාණ්ඩය, මී 800 තරඟ අවස්ථාවක්...


අනුශූරයෝ "සූර" නිවාසය


අතිශූර නිවාසය "වීර" සිය කුසලානය,අමාත්‍යතුමන් වෙතින් ලබාගැනීමෙන් අණතුරුව


"වීර"නිවාසය ජයග්‍රහණය බෙදාහදාගනිමින්


අතිශූර ක්‍රීඩක ශශික කුරුපනාවල


අතිශූර ක්‍රීඩිකාව ඉනෝකා සඳමාලි

# නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ ගැණෙන අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම් සම්බන්ධ ප්‍රතිපාදන

**ඉතා සීඝ්‍ර ලෙස සිදුවන අනවසර ඉදිකිරීම් ,එම නාගරිකයේ යහ පැවැත්මට එල්ල කරන්නේ සුවිශාල තර්ජනයකි . නාගරික සංවර්ධන අධිකාරිය මේ සම්බන්ධයෙන් ප්‍රධාන වගකීමක් දරන්නාවූත් නීතිය බලාත්මක කිරීමට හිමිකාරත්වය දරන්නාවූ ආයතනයයි.**

මේ ලිපිය ඒ සම්බන්ධයෙන් කෙරෙන්නනාවූ නීතිමය විවරණයකි.

නාගරික සංවර්ධන අධිකාරී බලතල හා කටයුතු හා සැලසුම් කිරීමේ කාර්ය පටිපාටිය 1978 අංක 41 පනත සහ එහි සංශෝධනයන් මගින් තහවුරු කර ඇත. ඒ අනුව නාගරික සංවර්ධන ප්‍රදේශයක සංවර්ධන සැලැස්මක් පිලියෙල කල යුතු බවත් එම සැලැස්ම අදාල ප්‍රදේශයේ ඉඩම් හා ගොඩනැගිලි පිලිබඳව ඒකාබද්ධවූ සැලසුම් කිරීම සහ භෞතික වශයෙන් සංවර්ධනය කිරීම ප්‍රවර්ධනය කිරීම සහ විධිමත් කිරීමේ අදහස ඇතිව අධිකාරිය විසින් ප්‍රජාව වෙත සපයා දෙනු ලබන පහසුකම් සහ සේවාවන් ගැන සැලකිලිමත්ම සලැස්මක් පිළියෙල කල යුතු බව 8 අ 1 වගන්තිය මගින් පැහැදිලි කර ඇත.

ඒ අනුව නාගරික සංවර්ධන ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශිත ප්‍රදේශයක සියලුම සංවර්ධ කටයුතු (ඉඩම් අනු කොටස් වලට බෙදීම්, ඉදිකිරීම් සහ භාවිතය වෙනස් කිරීම්) සිදු කල යුතු වන්නේ අවසර පත්‍රයක බලය යටතේ පමණි. ඒ බව 8 එ 1 වගන්තියෙන් පැහැදිලි වන අතර එවැනි ලබා ගත් බලපත්‍රයකට පටහැනිව කිසිදු සංවර්ධන කටයුත්තක් සිදු නොකල යුතු බව 8 ඒ 1 වගන්තිය විස්තර කර ඇත. මෙහි සඳහන් සංවර්ධන කටයුත්ත පිලිබඳව 1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනතේ 9 වන වගන්තිය වශයෙන් මුල් පනතේ 29 වන වගන්තියට කරන ලද සංශෝධන මගින් සංවර්ධන කටයුත්ත කුමක්ද යන්න නිර්වචනය කර ඇත.

සංවර්ධන කටයුත්තක් සඳහා ලබාගන්නා අවසරපත්‍රය වලංගු කාල සීමාව සහ අදාල ආනුශාංගික කරුණු 8 එ 2 වගන්තියෙන් පැහැදිලි කර දෙන අතර එසේ ලබා ගන්නා අවසර පත්‍රයකට අනුව නියම කරන ලද කිසියම් සංවර්ධන කටයුත්තක් වෙනුවෙන් අනුකූලතා සහතිකයක් ලබා ගැනීම පාර්ශවකරුවන්ගේ වගකීමක්වේ. මෙම සහතිකය ලබාගැනීමෙන් පසු අදාල ඉඩම හෝ ගොඩනැගිල්ල වෙනත් කාර්යයක් සදහා නොයෙදීමට පාර්ශවයන් වගබලා ගත යුතුවේ.

ඉහත සඳහන් කල අන්දමේ අවසර පත්‍රයක් නොලබා කරනු ලබන සියලුම සංවර්ධන කටයුතු අනවසර සංවර්ධන කටයුතු වශයෙන් හඳුන්වන අතර ඒ සඳහා ගතයුතු ක්‍රියාමාර්ගයන් මෙම පනතේ 28 වන වගන්තිය යටතේ ඉතා පැහැදිලිව විස්තරවේ. මෙහිදී එවැනි සංවර්ධන කටයුතු සඳහා 28 අ (1) යටතේ දින 07 ට නොඅඩු නොතිසියක් යැවීමට නීතිමය ප්‍රතිපාදන ඇති අතර, එම දැන්වීමෙන් අදාල සංවර්ධන කටයුත්ත වහාම නතර කරන ලෙස හෝ එය කඩා දමන ලෙස හෝ නැතහොත් ලබා ගත් අවසර පත්‍රයට අනුව කටයුතු කිරීමට නියම කිරීමේ හැකියාවක් නාගරික සංවර්ධන අධිකාරියට ඇත. ඒ අනුව නොතිසියකට අවනත නොවන පුද්ගලයන් හෝ ආයතනවලට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයට නඩු

පැවරීමේ නෛතික බලයද මෙම පනතින් ලැබී ඇති අතර එම බලය 1978 අංක 44 දරණ පනතින් සංශෝධන ඇතුලත් කර ඇත. එවැනි නඩුකරයකින් ලබා ගන්නා නියෝගයක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සියලුම සහායදීමේ කාර්යය පොලිසියේ කාර්යයක් වන බව පනතේ 28 අ 4 වගන්තිය යටතේ විස්තරවේ. තවද එවැනි ක්‍රියාවක් සම්බන්ධයෙන් කරන ලද සාධාරණ වියදමත් අයකර ගැනීමේ හැකියාවද නාගරික සංවර්ධන අධිකාරියට ඇති බව පනතේ 28 (5) වගන්තියේ දක්වා ඇත.
අනවසර සංවර්ධන කටයුත්තක් සදහා නඩු පැවරීමකදී පෙත්සමක් හා දිවුරුම් පෙත්සමක් මාර්ගයෙන් එම ක්‍රියාවලිය සිදු කල යුතුව ඇත. ඒ අනුව මෙවැනි නඩුකරයකදී කරුණු ඔප්පු කිරීමේ කාර්ය වගඋත්තරකාර පාර්ශවය වෙත පැවරෙන අතර නිසි අවසරපත්‍රයක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් මහේස්ත්‍රාත්වරයා විසින් ඒ පිලිබඳ නියෝගයක් නිකුත් කරනු ලබයි.

එමෙන්ම එවැනි නියෝගයක් අධිකාරියට බලය දෙමින් මහේස්ත්‍රාත්වරයා විසින් සිදුකරනු ලදුව එම නියෝගයට අනුව කටයුතු කිරීමට පාර්ශවයන් එකඟ වන්නේ නම් එවැනි නියෝගයක් මාස 02 ට නොඅඩු කාලයක් සඳහා අත්හිටුවිය හැකි බව 28 අ (3) ආ වගන්තිය මඟින් පැහැදිලි වේ. තවද මෙවැනි නඩුවක් ගොනු කර දින සිට දින 60 ක් ඇතුලත විසදා අවසන් කළ යුතු බවත් දින 90 ක් ඇතුලත නියෝගය ක්‍රියාත්මක කිරීම සඳහා සියලුම නියෝග නිකුත් කළ යුතු බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ 28 ඈ වගන්තිය මඟිනි.

### නඩු පැවරීමේ කාර්ය පටිපාටිය

පනතේ 8 එ 1 වගන්තිය යටතේ නිසි අවසර පත්‍රයක් නොමැතිව කරනු ලබන සංවර්ධන කටයුත්තක් වෙනුවෙන් පනත යටතේ 28 වගන්තිය යටතේ කරනු ලබන අවස්ථාවකදී එමෙන්ම 28 අ වගන්තියේ 1 වන උප වගන්තිය යටතේ දැන්වීමක් නිකුත් කර තිබියදී ඒ අනුව ක්‍රියාකර නොමැති අවස්ථාවක අදාල ඉඩම හෝ ගොඩනැගිල්ල පවත්නා තත්වයෙන්ම යම් කාර්යයක් සඳහා අධිකාරිය විසින් ප්‍රයෝජන ගැනීමට හැකිබව අමාත්‍යවරයා සෑහීමකට පත්වන්නේ නම් ගැසට් පත්‍රයේ පලකරනු ලබන නියමයක් මගින් එම ඉඩම හෝ ගොඩනැගිල්ල නාගරික සංවර්ධන අධිකාරී වෙත පවරා ගැනීමට නීතිමය හැකියාවක් ඇත.

එමෙන්ම 8 එ 1 වගන්තිය යටතේ ලබාගන්නා ලද අවසරපත්‍රයට අනුකූලව කරනු ලබන ඉදිකිරීමක් වෙනුවෙන් අනුකූලතා සහතිකයක් ලබා නොගෙන පදිංචි වන්නාවූ හෝ පදිංචිවීම ඉඩදෙනු ලබන්නාවූ යම් තැනැත්තෙකුට වරදට වරදකරුවකු වන බවත් ඒ සඳහා නීතිමය පියවර ගත හැකි බව 1989 අංක 49 දරණ පනතට ඇතුලත් කර ඇත.

### වරද සහ දණ්ඩන

1982 අංක 4 දරණ පනත යටතේ සැලසුම් කිරීමේ බලතල හා කටයුතු පනතේ 23 (5) වගන්තිය අනුව නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශිත ප්‍රදේශයක් ඇතුලත සැලසුම් කිරීමට අදාල නාගරික සංවර්ධන අධිකාරියේ පාලනය සහ අධීක්ෂණය යටතේ බලතල හා කර්තව්‍ය ඒ ඒ පළාත් පාලන ආයතන වලට පැවරීමේ හැකියාව ඇත.

මේ පිළිබඳව පළාත් පාලන ආයතන රාජකාරී විෂයෙහිලා නාගරික සංවර්ධන අධිකාරී රෙගුලාසි (නියෝග) අනුගමනය කිරීම පිළිබඳ නීතිමය පදනම;

### සැලසුම් කිරීමේ බලතල හා කටයුතු, නෛතික ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධ පළාත් පාලන ආයතන වෙත බලය අභිනියේජනය කිරීම



i සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පලකරනු ලබන නියමයක් මඟින් ප්‍රකාශයට පත් කිරීම 21 (2) වගන්තියේ දක්වා ඇත.(නාගරික සංවර්ධන අධිකාරිය අංක 396/9 සහ 1986 මාර්තු මස 10 වන දිනැති රෙගුලාසි

ii පනතේ 27 (1) ඡේදය අනුව යම් රීති සෑදීමට බලය ඇති අතර කිසිදු රීතියක් නාගරික සංවර්ධන අධිකාරී විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කරනා තෙක් බල නොපැවතිය යුතුය.

අනවසර ඉදිකිරීම් සම්බන්ධව අනෙකුත් ප්‍රතිපාදනයන්

- මහ නගර සභා පනතේ 42 (1) වගන්තිය
- නගර සභා පනතේ 84 වගන්තිය
- ප්‍රාදේශිය සභා පනතේ 52 වගන්තිය
- ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ පනත හා අදාල ප්‍රතිපාදන
- වෙරළ සංරක්ෂණ පනත හා අදාල ප්‍රතිපාදන

## තාක්ෂණ නිළධාරීන්ගේ වැඩමුළුව



නාගරික සංවර්ධන අධිකාරියේ පළාත් කාර්යාල වල නිරීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති වල නියැළී සිටින සියළුම තාක්ෂණ නිළධාරීන් කැඳවා තත්ව පාලනය හා සහතික වීම පිළිබඳව දැනුවත් කිරීම සඳහා නොවැම්බර් 10 වන සිකුරාදා දින නාගරික සංවර්ධන අධිකාරී ශ්‍රවණාගාරයේ දී උදය වරුවේ වැඩමුළුවක් පවත්වන ලදි.

මෙහිදී අධ්‍යක්ෂක ජනරාල් ඉංජිනේරු සුමේධ රත්නායක මහතා විසින් තාක්ෂණ නිළධාරීන්ගේ කාර්යයයේ වැදගත් කම පැහැදිලි කරන ලදි. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (උපදේශන) , (ව්‍යාපෘති) හා අනිකුත් ව්‍යාපෘති කළමනාකාර අධ්‍යක්ෂවරුන්ගේ අදහස්, සාකච්ඡා කිහිපයක්ම පැවතුණු අතර නාගරික සංවර්ධන අධිකාරියේ ඉංජිනේරු උපදේශන අංශය විසින් වැඩමුළුව සංවිධානය කර සම්පත් දායකත්වය ද සපයන ලදි.

වසර ගණනාවකට පසුව පැවැත්වුණු මෙම වැඩමුළුව බොහෝ දෙනෙකුගේ ප්‍රශංසාවට ලක්වුණු අතර ව්‍යාපෘති තත්වපාලන කළමනාකරණය පිළිබඳව බොහෝදේ සාකච්ඡා කෙරුණි. තාක්ෂණ නිළධාරීන් හා ඊට සහභාගී වූ අනිකුත් ව්‍යාපෘති හා විගණන නිළධාරීන් ඔවුන්ගේ රාජකාරී ගැටළු මතුකරන ලදුව ඒවා මඟ හැරීම සඳහා ඉදිරි වැඩ පිළිවෙල පිළිබඳව සාකච්ඡා කෙරුණි.

# බේරේ වැව ආශ්‍රිත ප්‍රදේශය සංවර්ධන සැලැස්ම 2017- 2025



මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ සෘජු මැදිහත්වීම යටතේ සිංගප්පූරුවේ TEMASHEK ආයතනයේ සහ Center for Livable Cities ආයතනයන්හි උපදේශකත්වය මත නාගරික සංවර්ධන අධිකාරියේ මූලිකත්වයෙන් සහ අනෙකුත් පාර්ශවකාර රාජ්‍ය ආයතනයන්ගේ සහභාගිත්වයෙන් සකස්කරන ලද බේරේ වැව සහ ඒ අවට ප්‍රදේශය සංවර්ධනය සඳහා වූ සංවර්ධන සැලැස්ම එළිදැක්වීම මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017 නොවැම්බර් මස 27 දින කොළඹ Jaic Hilton හෝටලයේදී පැවැත්විණි.



මේ සඳහා ඉහත සඳහන්කල සිංගප්පූරු උපදේශක ආයතනයන්හි නිළධාරීන් සහ සැලැස්ම සැකසීම සඳහා දායක වූ නාගරික සංවර්ධන අධිකාරිය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ අනෙකුත් පාර්ශවකාර රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන්හි නිළධාරීන් ද සහභාගීවීය.

බේරේ වැව සංවර්ධන සැලැස්ම, ප්‍රධාන අංග 4 ක් ඔස්සේ පෙළගස්වා ඇත.

- බේරේ වැව ආශ්‍රිත ප්‍රදේශය සඳහා වූ භූමි පරිභෝජන සැලැස්ම
- බේරේ වැවෙහි ජලය පිරිසිදු කිරීම සහ තත්වය වැඩිදියුණු කිරීමේ සැලැස්ම
- බේරේ වැව ආශ්‍රිත ප්‍රදේශය සඳහා වූ නිවාස සැලැස්ම
- බේරේ වැව ව්‍යාපාරික සැලැස්ම

මෙම වැඩසටහනට සමගාමීව, පළාත්පාලන ආයතනයන්හි සහ නගර සැලසුම් සම්බන්ධ අනෙකුත් ආයතනයන්හි නිළධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් 2017 නොවැම්බර් මස 28 දින තලවතුගොඩ සනෝරා උත්සව ශාලාවේදී පැවැත්විණි.



## We follow social market economy

....From 2nd page

Sri Lanka is blessed with a well-educated population, it is a free society devoid of any serious division based on sex or ethnicity, we also have a solid legal framework, our environment is very clean, our standards are high, and we are situated in a very strategic location in the Indian Ocean.From Africa to Iran, Iran to India, India to Myanmar, Myanmar to Indonesia we are the hub of the Indian Ocean. Therefore, in order to keep your foot print and the foothold in the hub we invite you all.

Our Ministry has shown during the last two years how we can manage our own affairs without depending on the finances from the General Treasury. The UDA under our directives has been modernized and the Ministry will be converted to a digital platform.

To elevate the index of Doing business in Sri Lanka, UDA has contributed heavily. The construction industry's growth of 12.8 % was mainly due to the activities of the UDA. I am pleased to inform you that UDA is now governed by a set of professionals consisting of Engineers, Accountants and Architects without any political influence or affiliation. Therefore, I am requesting for you all to come and invest with us without any fear.

In conclusion, let me thank the UDA leadership for organizing this timely event & I want to inform all the prospective investors that my doors are always open to you all and anyone can come and discuss any issue with me. We will be acting on the principle of three C's that is Complain, Collaborate and comply.
Thank you.

සංස්කරණය

ව්‍යාපාර ප්‍රවර්ධන ඒකකය,
6 වන මහල, නාගරික සංවර්ධන අධිකාරිය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

www.facebook.com/uda.gov.lk
www.uda.gov.lk